# <u>මුදල් හා මූල්‍ය ආයතන</u>

## <u>මුදල්</u>

''භාණ්ඩ හා සේවා හුවමාරුවේදී  පොදුවේ පිළිගනු ලබන ඕනෑම දෙයක්'' මුදල් ලෙස හැඳින්විය හැකිය.

<u>මුදලේ කාර්යයන්</u>

1. විනිමය මාධ්‍යක් ලෙස කටයුතු කිරීම
   භාණ්ඩ හා සේවා හුවමාරුවේදී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීම මෙහි අදහසයි. ඕනෑම භාණ්ඩයක් හෝ සේවයක් සඳහා මුදල් ද මුදල් ඕනෑම භාණ්ඩයක් හෝ සේවයක් සඳහාද හුවමාරු කරගත හැකි බන් මින් අදහස් කරයි.
   උදා : රු. 25000 කට දුරකතනයක් මිලදී ගැනීම

2. වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම
   භාණ්ඩ හා සේවාවන්හි වටිනාකම හෙවත් අගය මැනීම සඳහා මුදල් භාවිත කිරීම මින් අදහස් වේ. මෙය ''මිල'' නම් වේ. මෙමඟින් ගිණුම් තැබීම පහසු වී ඇති නිසා මෙය 'ගිණුම් ඒකකයක්' ලෙසද හඳුන්වයි.
   උදා : නවකතා පොතකට රු. 300.00 ක මිලක් නියම කිරීම.

3. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම
   කාසි හා නෝට්ටු යල් පැනීමකින් හෝ ක්ෂය වීමකින් තොරව රැස් කර තබා ගත හැකි බව
   උදා :  රු. 1000 ක මුදලක් ඉතිරි කිරීම.

4. විලම්භිත ගෙවුම් මාධ්‍යක් ලෙස කටයුතු කිරීම
   අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගත හැකිය. එම නිසා මෙය 'අනාගත ගෙවුම් මාධ්‍යක්' ලෙසද හඳුන්වයි.
   උදා : මාර්තු මාසයේ කළ ගනුදෙනුවකට අදාළව අප්‍රේල් මාසයේ මුදල් ගෙවීමට ගිවිස ගැනීම.

ඉහත කාර්යයන් මුදලේ ප්‍රාථමික කාර්යයන් සහ ද්විතියික කාර්යයන් ලෙස වර්ග කර හඳුනා ගනියි.

1. ප්‍රාථමික කාර්යයන්
   මෙම කාර්යයන් ආර්ථිකයේ පැන නගින කුමන තත්වයක් යටතේ වුවද එහි වැදගත්කම නොවෙනස්ව පවතින නිසා 'ප්‍රාථමික කාර්යයන්' ලෙස හඳුන්වයි. එනම් උද්ධමන හෝ අවධාමනකාරී තත්වයකදී උවද මෙම කාර්යයන් කාර්යක්ෂමව සිදු කෙරෙයි.
   - විනිමය මාධ්‍යක් ලෙස කටයුතු කිරීම
   - වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම
2. ද්විතියික කාර්යයන්
   ආර්ථිකයේ උද්ධමන හෝ අවධමනකාරි තත්වයකදී එක් පාර්ශ්වයකට අවාසියකුත් අනෙක් පාර්ශවයට වාසියකුත් අත්වන බැවින්ද, ප්‍රාථමික කාර්යයන් නිසා පැන නගින උපකාර්යයන් බැවින්ද මේවා ද්විතියික කාර්යයන් ලෙස හඳුන්වයි.
   - විලම්භිත ගෙවුම් මාධ්‍යක් ලෙස කටයුතු කිරීම
   - වටිනාකමේ සන්නිධියක් ලෙස කටයතු කිරීම

__හොඳ මුදලක ලක්ෂණ__

1. පොදු පිළිගැනීම / සාර්ව ප්‍රතිග්‍රාහිතතාව
2. කුඩා ඒකක වලට බෙදිය හැකිවීම
3. කල්පැවැත්ම
4. ගෙනයාමේ පහසුව
5. පහසුවෙන් හඳුනාගත හැකි වීම / සමජාතීය වීම
6. අනුකරණය අපහසු වීම
7. සුලභ හෝ දුලභ නොවීම
8. නාමික අගය ද්‍රව්‍යමය අගයට වඩා වැඩි වීම

__හුවමාරු මාධ්‍යයේ විකාශනය__




- ද්‍රව්‍ය මුදල් භාවිතය
  භාණ්ඩ හුවමාරුවේ පැවති දුෂකරතා අවම කර ගැනීමට ඉක්මනින් නශ්‍ය නොවන දුම්කොළ, ඇත්දළ, සිප්පි කටු වැනි විවිධ ද්‍රව්‍ය භාවිත කළහ.

- ලෝහ මුදල් භාවිතය
  ද්‍රව්‍ය මුදල් භාවිතයේ ගැටළු නිසා රන්, රිදී, ලෝකඩ ආදී ලෝහ වර්ගත් පසුව මෙම ලෝහ වලින් තැනූ කාසිත් භාවිතා කල අතර මේවා "පූර්ණ මුදල්"”ලෙස හඳුන්වයි.

- ව්‍යවහාර මුදල් / කාසි හා නෝට්ටු
  වර්තමානයේ භාවිතා කරන මුදල් ය. එනම් රටක මුල්‍ය අධිකාරිය විසින් එරට ප්‍රධාන මුදල් ඒකකය යටතේ නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු ය. මේවා පූර්ණ ද්‍රවශීලතාවයෙන් යුක්තය. නිත්‍යානුකූල මුදල්, නියෝග මුදල්, වලංගු මුදල්, ප්‍රඥප්ති මුදල්, නිමිති මුදල් යන නම් වලින්ද හඳුන්වයි.

- බැංකු මුදල්
  වාණිජ බැංකු වල පවත්වාගෙන යන ඉල්ලුම් තැන්පතු වල ශේෂයන් ‘බැංකු මුදල්’ ලෙස හඳුන්වයි. මේවා චෙක්පත් ආධාරයෙන් ගනුදෙනු සඳහා යොදා ගනියි.

- ආසන්න මුදල්
  ව්‍යවහාර මුදල් මෙන් 100% ක් ද්‍රවශීල නොවූවද පහසුවන් හා වැඩි අලාභයකින් තොරව කෙටිකලකින් මුදල් බවට පත් කර ගතහැකි මුදල් ය. ඉතිරුම් තැන්පතු, ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ණයකර තැන්පතු ආදිය උදාහරණ වේ.

## <u>මූල්‍ය ආයතන</u>

**මූල්‍ය පද්ධතිය තුළ සිදු කෙරෙන වැදගත්ම කාර්යය වන්නේ මූල්‍ය අතරමැදිකරණයයි.**

**මූල්‍ය කටයුතුවල නිරත වන මූල්‍ය අතරමැදියන් 'මූල්‍ය ආයතන' ලෙස හඳුන්වයි.**

<u>මූල්‍ය ආයතන වර්ගීකරණය</u>

1. බැංකු අංශය
    a. මහ බැංකුව
    b. බලපත්‍රලාභී වාණිජ බැංකු
    c. බලපත්‍රලාභී විශේෂිත බැංකු

2. තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන
    a. බලපත්‍රලාභී මුදල් සමාගම්
    b. ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු
    c. සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති

3. විශේෂිත මූල්‍ය සමාගම්
    a. කල්බදු සමාගම්
    b. ඒකක භාර සහ ඒකක භාර කළමනාකරණ සමාගම්
    c. කොටස් තැරැව්කරුවන්
    d. ප්‍රාථමික අලෙවිකරුවන්
    e. ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්
    f. වෙළඳපල අතරමැදියන්

4. ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන
    a. රක්ෂණ සමාගම්
    b. සේවක අර්ථසාධක අරමුදල
    c. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල
    d. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

## ශ්‍රී ලංකා මහ බැංකුව

**1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු මස 28 දින ආරම්භ කරන ලදී. මෙහි ප්‍රථම අධිපතිවරයා ජෝන් එක්ස්ටර් (නොමියෙන බැංකුකරුවා) විය.**

**ශ්‍රී ලංකා මහ බැංකුව පාලනය වන්නේ මුදල් මණ්ඩලය මගිනි. එය මහ බැංකු අධිපති, මුදල් විෂයභාර අමාත්‍යාංශ ලේකම් සහ පත්කළ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විතය.**

<u>මහා බැංකුවේ ප්‍රධාන අරමුණු</u>

1. මිල ස්ථායිතාව
   - රටක සාමාන්‍ය මිල මට්ටම ඉහළ පහළ යාමට නොදී ස්ථාවර මට්ටමක, එනම් උද්ධමන අවධමනකාරී තත්වයන්ගෙන් තොරව පවත්වාගැනීම

2. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව
   - ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව ලෙස හැදින්වේ. එනම් මූල්‍ය පද්ධතියට එල්ල විය හැකි තර්ජනයන් හදුනා ගැනීම හා ඒවා අවම කිරීම තුළින් මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමයි. මේ සඳහා 2007 වසරේදී මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවක්ද පිහිටුවිය.

<u>මහබැංකුවේ කාර්යයන්</u>

1. මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම.
2. විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම.
3. ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය.
4. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම.
5. රජයේ බැංකුව ලෙස කටයුතු කිරීම හා බැංකුවල බැංකුකරුවා ලෙස කටයුතු කිරීම.
6. බැංකු හා බැංකු නොවන ආයතන වල අධීක්ෂක ලෙස කටයුතු කිරීම.
7. බැංකු වල අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කිරීම.
8. නියෝජ්‍යත්ව කටයුතු
   - රාජ්‍ය ණය පාලනය
   - විදේශ විනිමය පාලනය
   - සේවා අර්ථසාධක අරමුදල් පාලනය
   - කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු වල බැංකුකරුවා ලෙස හැදින්වීමට හේතු

i. වාණිජ බැංකු වලට අවසන් ණය දෙන්නා වශයෙන් කටයුතු කිරීම
ii. වාණිජ බැංකු වලට අවශ්‍ය උපදෙස් හා අනෙකුත් සේවා සැපයීම
iii. වාණිජ බැංකු වලට ගෙවීම් හා පියවීම් පහසුකම් සැපයීම
iv. වාණිජ බැංකු අධීක්ෂණය කිරීම
v. පොළී අනුපාතික, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, විවට වෙළඳපල කටයුතු ආදිය මගින් වාණිජ බැංකු හැසිරවීම.

ශ්‍රී ලංකා මහබැංකුව රජයේ බැංකුව ලෙස හැදින්වීමට හේතු

i. රජයේ විවිධ ගිණුම් පවත්වාගෙන යාම.
ii. රාජ්‍ය ණය කළමනාකරණය
iii. රජයේ ආර්ථික උපදේශකවරයා වශයෙන් කටයුතු කිරීම.
iv. රජය වෙනුවෙන් අන්තර්ජාතික සංවිධාන සහ රටවල් සමග කටයුතු කිරීම.

ව්‍යාපාර වල සාර්ථකත්වයට මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාරය

- ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)
  පරිගනක භාවිත කරමින් බැංකු අතර සිදුවන ගනුදෙනු පියවීම සඳහා භාවිත කරන ක්‍රමයකි. වර්තමානයේ මෙය මහ බැංකුවට සහ වාණිජ බැංකුවලට හවුල් අයිතියක් ඇති සී/ස ලංකා ක්ලියර් (පෞද්) සමාගම විසින් සිදු කරයි.
  චෙක්පත් නිෂ්කාශන පද්ධතිය ක්‍රියාත්මක කිරීමත්, අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සී/ස ලංකා ක්ලියර් (පෞද්) සමාගමේ ප්‍රධාන කාර්යයන් වේ.

- ජගත් අන්තර් බැංකු මුල්‍ය මුල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය (SWIFT)
  සාමාජික බැංකු අතර ජාත්‍යන්තර වශයෙන් සිදුවන මුල්‍ය ගනුදෙනු ඉතා ඉක්මනින්, පහසුවෙන් හා වඩා නිවැරදිව හුවමාරු කර ගැනීම සඳහා භාවිත කරන සේවාවකි.

- තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS)
  මුල්‍ය ආයතන අතර සිදු වන වැඩි වටිනාකමක් ඇති ගනුදෙනු සහ ඉතා හදිසි ගනුදෙනු ක්ෂණිකව, පහසුවෙන් හා විශ්වාසයෙන් යුතුව සිදු කිරීමට හඳුන්වා දී ඇති නවීන විද්‍යුත් ගෙවීම් හා පියවීම් පද්ධතියයි.

- ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය (SSDS)
  සුරැකුම්පත් මිලදී ගැනීමේදී හෝ විකිණීමේදී මුද්‍රිත සුරැකුම්පත් සහතික වෙනුවට ලේඛන රහිතව භාවිත කරන ක්‍රමයකි. මෙය LANKA SECURE යන නමින්ද හඳුන්වයි.

  ඉහත තත්කාලින දළ පියවුම් පද්ධතිය සහ ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය එක්ව ගත්විට එය LANKA SETTLE ලෙස හඳුන්වයි.

## බලපත්‍රලාභී විශේෂිත බැංකු

බැංකු පනත යටතේ විශේෂිත බැංකු කටයුතු පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහා බැංකුවෙන් බලපත්‍ර ලබාගෙන ඇති මුල්‍ය ආයතන මෙනමින් හඳුන්වයි. මේවාට සංවර්ධන/ආයෝජන බැංකු සහ ඉතිරිකිරීමේ බැංකු අයත් වේ.

මේවාට ජංගම ගිණුම් පවත්වාගෙන යාමට හා විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමට අවසර නොමැත. උදාහරණ ලෙස,

- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුව
- ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන අයුරු

1. කාලින හා ඉතිරි කිරීමේ තැන්පතු භාර ගැනීම
2. විවිධ ක්ෂේත්‍ර වල ව්‍යවසායකයින්ට ණය සැපයීම
3. සමාගම් වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු සිදු කිරීම
4. කල්බදු පහසුකම් සැපයීම
5. කළමනාකරණ උපදේශන සේවා

## බලපත්‍රලාභී වාණිජ බැංකු

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් යටතේ ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් ගිණුම් පවත්වාගෙන යාම හා මුදල් මැවීමේ හැකියාව ඇති, විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීමට අවසර ඇති මූල්‍ය ආයතනයි.

වාණිජ බැංකු රාශියක් ක්‍රියාත්මක වන අතර ඒවා දේශීය(13) හා විදේශීය(12) වාණිජ බැංකු වශයෙන් වර්ග කෙරේ.

වාණිජ බැංකු වල අරමුණු

1. ලාභදායිත්වය වර්ධනය
   වාණිජ බැංකුවක ආයෝජනයට ප්‍රමාණවත් ලාභයක් ලැබීමයි.

2. ද්‍රවශීලතාව ආරක්ෂා කිරීම
   වාණිජ බැංකුවකට එදිනෙදා ගනුදෙනු සඳහා මුහුණදීමට ඇති හැකියාවයි. එනම් ගනුදෙනුකරුවන් තුළ බැංකුව කෙරෙහි විශ්වාසය තහවුරු කිරීම සඳහා ඉල්ලූ විට මුදල් ආපසු ලබා දීමට ඇති හැකියාවයි.

ලාභදායිත්වය සහ ද්‍රවශීලතාව අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධයකි. ද්‍රවශීලතාව අරක්ෂා කරගෙන මහජන විශ්වාසය දිනා ගැනීමට පමණක් කටයුතු කරන්නේ නම් ලාභාදයිත්වය අඩු වන අතර ලාභදායිත්වය වැඩි කර ගැනීමේදී ද්‍රවශීලතාව අඩු වේ. එවිට එදිනෙදා කටයුතු අඩපණ වී මහජන විශ්වාසය ගිලිහි යයි. එබැවින් වාණිජ බැංකු තම වත්කම් ව්‍යුහය සකස් කර ගැනීමේදී ලභාදායිත්වය හා ද්‍රවශීලතාව අතර තුලනයක් ඇති කරගත යුතුය.

වාණිජ බැංකු වල ප්‍රධාන කාර්යයන්/ සේවා

1. ණය ආශ්‍රිත සේවා
2. තැන්පතු ආශ්‍රිත සේවා
3. නියෝජිත සේවා
4. පොදු උපයෝගිතා සේවා

ණය ආශ්‍රිත සේවා

- අයිරා පහසුකම්
  බැංකු ජංගම ගිණුමේ ශේෂය ඉක්මවා නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට ඇති හැකියාව බැංකු අයිරා පහසුකම ලෙස හඳුන්වයි.
  මේවා තාවකාලික අයිරා සහ ස්ථාවර අයිරා පහසුකම් ලෙස වර්ග කෙරෙයි.

- බැංකු ණය
  කිසියම් පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගන්නා ණය මුදල සහ ඊට අදාළ පොලිය ආපසු ගෙවීමට එකග වෙමින් බැංකුවක් ලබා දෙන මුදලකි.
  මෙය ප්‍රධාන ආකාර දෙකකි.
  1. ව්‍යාපාරික ණය
     පුද්ගලයෙකුට හෝ ආයතනයකට තම ව්‍යාපාරික කටයුතු සඳහා කෙටි, මැදි හෝ දිගු කාලීනව ලබා දෙන ණය
  2. පාරිභෝගික ණය
     වත්කම් මිලට ගැනීමට හා හදිසි අවස්ථා පිරිමසා ගැනීමට පුද්ගලයින්ට ලබා දෙන ණය

බැංකු අයිරා පහසුකම ලබා ගැනීමට ජංගම ගිණුමක් අත්‍යවශ්‍ය වන නමුත් බැංකු ණය ලබා ගැනීමට ජංගම ගිණුමක් අත්‍යවශ්‍ය නොවේ.

තැන්පතු ආශ්‍රිත සේවා

ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු), ස්ථාවර තැන්පතු, ඉතිරුම් තැන්පතු පවත්වාගෙන යාම වාණිජ බැංකුවක තැන්පතු ආශ්‍රිත සේවා යටතට ගැනේ.

1. ජංගම ගිණුම්
   චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම ඇති, ශේෂය මත පොළී හිමි නොවන ගිණුම් වර්ගයකි. බැංකු අයිරා පහසුකම් ලබා ගත හැකි අතර ටෙලර් කාඩ්පත් භාවිතයෙන්ද ගනුදෙනු කල හැකිය.

   ජංගම ගිණුම් තුළින් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි / පහසුකම්
   - චෙක්පත් මගින් ගෙවීම් කල හැකි වීම
   - ප්‍රේෂණ පහසුකම්
   - නිත්‍ය නියෝග මත ගෙවීම්
   - අයිරා පහසුකම්
   - බැංකු වාර්තාවක් ලබා ගත හැකිවීම
   - ආරක්ෂා සහිත වීම / ගෙවූ බවට සාක්ෂ්‍යක් සහිත වීම

2. ඉතිරුම් තැන්පතු
   ඉතිරිකිරීමේ පරමාර්ථයෙන් හඳුන්වා දී ඇති මෙම ගිණුම් වලට ශේෂය මත පොළියක් හිමි වේ. තැන්පතුකරුගේ අභිමතය පරිදි මුදල් තැන්පත් කිරීම සහ ආපසු ලබා ගැනීම සිදු කල හැකිය. ටෙලර්පත් මගින් ගනුදෙනු සිදු කල හැකිය.

3. ස්ථාවර තැන්පතු
   නිශ්චිත කල්ච්ඡේදයක් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොළී අනුපාතයක් යටතේ තැන්පත් කිරීම මෙහිදී සිදුවේ. ඉතිරිකිරීම් තැන්පතු වලට සාපේක්ෂව වැඩි පොළියක් හිමි වේ.

4. කාලින තැන්පතු
   ස්ථාවර තැන්පතු ගිණුමකට සමාන වන වන නමුත් වෙනසකට ඇත්තේ නිශ්චිත කල්පිරීමක් දක්නට නොලැබීමත් වරින් වර මුදල් තැන්පත් කිරීමටත් ඇති හැකියාවයි.

| ඉල්ලුම් තැන්පතු | ස්ථාවර තැන්පතු | ඉතිරුම් තැන්පතු |
|---|---|---|
| 1.චෙක් පොතක් ලැබේ.<br>2.චෙක්පත් නිකුත් කිරීමට අවසර ඇත.<br>3.ශේෂයට පොළියක් හිමි නොවේ.<br>4.වාණිජ බැංකු වලට පමණක් භාර ගැනීමට අවසර ඇත.<br>5.නිශ්චිත කාලයක් දක්නට නැත. | 1.කාඩ්පතක් ලැබේ.<br>2.චෙක්පත් නිකුත් කල නොහැකිය<br>3.ශේෂය මත පොළියක් හිමිවේ. සාපේක්ෂව පොලිය වැඩිය.<br>4.වාණිජ බැංකු මෙන්ම අනෙකුත් මූල්‍ය ආයතන වලටද භාර ගැනීමට අවසර ඇත.<br>5.නිශ්චිත කාලයක් දක්නට ඇත.<br>6. වරින් වර මුදල් තැන්පත් කල නොහැක. | 1.පාස්පොතක් හිමිවේ.<br>2.චෙක්පත් නිකුත් කල නොහැකිය<br>3.ශේෂය මත පොළියක් හිමිවේ. සාපේක්ෂව පොලිය අඩු ය.<br>4.වාණිජ බැංකු මෙන්ම අනෙකුත් මූල්‍ය ආයතන වලටද භාර ගැනීමට අවසර ඇත.<br>5.නිශ්චිත කාලයක් දක්නට නැත. |

පොදු උපයෝගිතා සේවා

1. කල්බදු සේවා
   ව්‍යාපාරවලට අවශ්‍ය වත්කම් කල්බදු පහසුකම යටතේ ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම.

2. උකස් සේවා
   ස්වර්ණාභරණ ආදිය ඇපයට ගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබා දීම

3. සුරක්ෂිතාගාර පහසුකම්
   පුද්ගලයින්ගේ වටිනා භාණ්ඩ සහ ලියකියවිලි ආරක්ෂා කර දීම සඳහා වාණිජ බැංකු විසින් විශේෂිත සේප්පු විශේෂයක් පවත්වාගෙන යයි.

4. විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම
   ගනුදෙනුකරුවන්ගෙන් විදේශ මුදල් මිලට ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් විකිණීමත් සිදු කරයි.

5. බැංකු අණකර නිකුත් කිරීම
   කිසියම් පුද්ගලයෙකු වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් තැන්පතු ලෙස භාරගෙන වෙනත් පුද්ගලයෙකුට එම මුදල ගෙවීම පිණිස බැංකුව එකඟ වෙමින් නිකුත් කරන අණකරය මින් අදහස් වෙයි.

6. සංචාරක චෙක්පත් නිකුත් කිරීම
   දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරීව සිදු කිරීම සඳහා භාවිත කෙරෙන චෙක්පත් විශේෂයකි.

7. ණයවර ලිපි නිකුත් කිරීම
   ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකඟ වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියක් නම් වේ.

8. ස්වයංක්‍රිය බැංකු සේවා
   බැංකු ගිණුම් හිමියන්ට තම බැංකුවෙන් ලබාදී ඇති පහසුකම් බොහොමයක් බැංකුවට නොගොස් ඕනෑම වේලාවක ලබා ගැනීමට හැකි වන අයුරින් හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයකි.

| ගනුදෙනුකරුවන්ට අත්වන වාසි | බැංකුවට අත්වන වාසි |
|---|---|
| • ටෙලර් කාඩ්පත් මගින් ගිණුමෙන් මුදල් ආපසු ගැනීම<br>• ගිණුමට මුදල් තැන්පත් කිරීම<br>• ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම<br>• ගිණුමේ ශේෂය දැන ගත හැකි වීම<br>• බිල්පත් ගෙවීමේ පහසුකම්<br>• කාලය ඉතිරි වීම | • පිරිවැය අඩු වීම<br>• තදබදය අඩු වීම<br>• නිරවද්‍යතාව ඉහළ වීම<br>• කාර්ය මණ්ඩලය අඩු කරගත හැකිවීම<br>• බැංකු සේවා පුළුල් වීම නිසා ලාභදායිත්වය වැඩි වීම |

9. විද්‍යුත් බැංකු සේවා
අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදු කර ගැනිම සඳහා ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම යි.
එවැනි පහසුකම් අතර,

- **HOME-BANKING**
  තම නිවසේ සිට පෞද්ගලික පරිගණකය මගින් අන්තර්ජාලයට සම්බන්ධ වී ඒ හරහා බැංකුවේ වෙබ් අඩවියට පිවිස බැංකු සේවා ඉටු කරගත හැකිය.

- **TELE BANKING** (දුරකථන බැංකු සේවා)
  ගනුදෙනුකරු බැංකුව වෙත නොගොස් තම දුරකථනය භාවිත කිරීමෙන් බැංකු සේවා ඉටු කර ගැනීම මේ යටතේ සිදු වෙයි.

10. ණයපත් සේවාව
කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතන වලින් භාණ්ඩ හා සේවා ණයට ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි. උදාහරණ ලෙස VISA කාඩ්, MASTER කාඩ්, AMERICAN EXPRESS කාඩ් දැක්විය හැකිය.

<u>නියෝජිත සේවා</u>

1. මුදල් ප්‍රේෂණ කටයුතු
   ගිණුම්හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම

2. ස්ථාවර නියෝග කටයුතු කිරීම
   ගනුදෙනුකරුගේ විවිධ ගෙවීම් ඉටු කිරීමට බැංකුවට පැවරීම

3. කොටස් ප්‍රාරක්ෂණය
   සමාගමක් කොටස් නිකුත් කිරීමේදී අවම සහභාග මුදල නොලැබේය යන අවධානම රක්ෂණය කිරීම මෙහිදී සිදුවේ.

4. මූල්‍ය උපදේශන සේවා පවත්වා ගැනීම

5. භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම හා විකිණීම

<u>වාණිජ බැංකු තරඟකාරිත්වය ජය ගැනීම සඳහා ගන්නා පියවර</u>

1. විවිධ ආකර්ශනිය ණය ක්‍රම හඳුන්වා දීම (රන්සුමිතුරු, සහන්යා)
2. විවිධ ආකර්ශනිය ඉතිරි කිරීමේ ගිණුම් හඳුන්වා දීම (පැතුම් විමන, 18 Plus)
3. බැංකු සේවා පුළුල් කිරීම හා කුඩා බැංකු ඇරඹීම (MINI COM BANK)
4. භාණ්ඩ අලෙවිසැල් ආරම්භ කිරීම (COM ඔසුසල)
5. නව ටෙලර්පත්, ණයපත්, හරපත් හඳුන්වා දීම (VISA ELECTRONIC, .COM)
6. රක්ෂණ සේවා, කල්බදු සේවා සහ වෛද්‍ය සේවා වැනි විවිධ අංශ වෙත යොමු වීම
7. ඉලෙක්ට්‍රොනික් මුදල් පැවරුම් ක්‍රම හඳුන්වා දීම (E – Exchange, Com- Bank)

## බලපත්‍රලාභී මුදල් සමාගම්

කාලින තැන්පතු භාර ගැනීමත් එම මුදල් මත ණය දීම සහ ආයෝජනයට පහසුකම් සලසන, මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහා බැංකුවෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති පොදු සමාගම් විශේෂයකි. මේවා ආසන්න බැංකු ලෙසද හඳුන්වයි.

බලපත්‍රලාභී මුදල් සමාගමක කාර්යභාරය

1. කුලිපිට ගැනුම් පහසුකම් සැපයීම
2. දේපල හා ඉඩම් වෙළඳාම් කිරීම
3. කල්බදු මූල්‍යකරණය
4. කෙටිකාලින ණය සැපයීම
5. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
6. කාලින තැන්පතු භාර ගැනීම

## සමුපාකාර ග්‍රාමීය බැංකු

සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් කාලින හා ස්ථාවර තැන්පත් භාර ගැනීම සහ සිය සාමාජිකයන්ට ණය සැපයීම ප්‍රධාන කාර්යය කරගත් ආයතන විශේෂයකි.

සමුපාකාර ග්‍රාමීය බැංකු වල කාර්යයන්

1. සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් තැන්පතු භාර ගැනීම
2. උකස් කටයුතු කිරීම
3. ඉතිරිකිරීම් හා ස්ථාවර තැන්පත් භාර ගැනීම
4. සාමාජිකයින්ට ණය සැපයීම
5. සමුපාකාර ජිවන ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම

## සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපාකාර සමිති (සණස)

ඉතිරි කිරීම දිරිමත් කිරීමත්, සාමාජිකයින්ට ණය සැපයීමත් අරමුණු කරගෙන සාමාජිකයින්ගෙන් ඉතුරුම් ලෙස හා සාමජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය සපයන, සමුපාකාර පනත යටතේ ලියාපදිංචි කල ආයතන විශේෂයකි.

සණස සමිති වල කාර්යයන්

1. සාමාජිකයන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
2. සමිතිය නියැලි ක්ෂේත්‍රයේ උපකරණ සහන මිලට ලබා දීම.
3. තැන්පතු භාර ගැනීම.
4. සාමාජිකයින්ට ණය සැපයීම.

## කල්බදු සමාගම්

**ව්‍යාපාරිකයන්ට අවශ්‍ය විවිධ වත්කම් භාවිතා කිරීම පිණිස ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන කටයුත්ත කරගත් ආයතන විශේෂයකි.**

උදා : සමුපාකාර ලිසිං ලිමිටඩ්, සී/ස ලංකා ඔරික්ස් ලිසිං සමාගම, මර්කන්ටයිල් ලිසිං සමාගම

- කල්බදු ගිවිසුම් ප්‍රධාන ආකාර 03කි.
    1. මෙහෙයුම් කල්බදු
       නිශ්චිත කාලසීමාවක් නොමැතිව ඇති කර ගන්නා ගිවිසුමක් මගින් මෙහෙයුම් කල්බදු ක්‍රියාත්මක වේ. දෙපාර්ශවයෙන් එක් පාර්ශවයකගේ දැනුම්දීම මත ගිවිසුම අහෝසි කල හැකි වීම මෙහි විශේෂ ලක්ෂණයකි. මෙහිදී කලින් කල බද්ද ගෙවා වත්කම භාවිතයට ගන්නා අතර නඩත්තු කටයුතු බොහෝ විට කල්බදු සමාගම විසින් සිදු කරයි.

    2. මූල්‍ය කල්බදු
       වත්කම භාවිතයට ගිවිස ගෙන ඇති කාලය තුළ කල් බද්ද මාසිකව ගෙවීමේ ක්‍රමයට ඇති වන ගිවිසුමකි. මෙහිදී වත්කම භාවිත කලත් නැතත් අදාළ කාලයට බදු ගෙවිය යුතුය. නඩත්තු හා අනෙකුත් සේවා සැපයීම කලබදු සමාගම භාර නොගනියි. ඒකපාර්ශ්වියව ගිවිසුම අවලංගු කිරීමද කළ නොහැකිය.

    3. විකුණා ආපසු කල්බදු ගැනීම
       ආයතනයක් සතු වත්කමක් කල් බදු සමාගමකට විකුණා නැවත එම වත්කම කල්බදු ක්‍රමයට ලබා ගැනීම මෙහිදී සිදු වේ. ආයතනයට වත්කම විකිණීමෙන් මුදල් ලැබෙන අතරම නැවත වත්කම භාවිතයටද මෙමගින් අවස්ථාව හිමි වේ.

<u>කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයන්ට අත්වන වාසි</u>

1. විශාල වටිනාකම් සහිත වත්කම් භාවිතයට අවශ්‍ය ඉඩකඩ සලසා දීම.
2. විශාල මුදලක් ආයෝජනය කිරීමකින් තොරව වැඩි අදායමක් ඉපයිය හැකි වීම.
3. කල්බදු සඳහා ගෙවන පොලිය බද්දෙන් නිදහස් වීම.
4. ව්‍යාපාර ශේෂ පත්‍රයේ වගකීම් ලෙස ප්‍රදර්ශනය නොවීම.
5. යන්ත්‍ර කල්පැනීම් නිසා සිදුවන පාඩු මග හැරී යාම.

## ඒකක භාර සහ ඒකක භාර කළමනාකරණ සමාගම්

**ආයෝජකයින්ට ඒකක විකිණීමෙන් රැස් කරගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කරගත් අරමුදල් ආයෝජන කලඹක යොදවනු ලබන අතර එහි ප්‍රතිලාභ ඒකක මිලට ගත් ආයෝජකයින් අතරේ බෙදා හරිනු ලබයි. *ආයෝජන මාර්ග කිහිපයක කරන ලද ආයෝජන කිහිපයක එකතුවක් "ආයෝජන කලඹක්" ලෙස හඳුන්වයි.***

**ඒකක භාරයක් ප්‍රධාන පාර්ශ්ව තුනකින් සමන්විතය. එනම් ඒකක භාරකරු, අරමුදල් කළමනාකරණ සමාගම සහ ඒකක හිමියන් / ආයෝජකයින් ය.**

<u>ඒකක භාරයක ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ</u>

- විවිධාංගිකරණය වූ ආයෝජන වල මුදල් යෙදවීම නිසා අවධානම අඩු වීම.
- වඩා ලාභදායි ආයෝජන වල තම අරමුදල් ආයෝජනය කල හැකි වීම.
- ඒකක භාර නැවත ඒකක භාරයටම අලෙවි කල හැකි වීම.
- බදු සහන ලබා ගත හැකි වීම.
- අවම ආයෝජනයකින් ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.

## කොටස් තැරැව්කරුවන්

සංස්ථාපිත සමාගම් වල කොටස් හෝ ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු කිරීමේදී අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන යි. මේ සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය. උදා: ආශා පිලිප්ස් සුරැකුම්පත් සමාගම, ඒෂියා සුරැකුම්පත් සමාගම

කොටස් තැරව්කාර ආයතන වල කාර්යයන්

1. ආයෝජකයින්ගේ ගැනුම් ඇණවුම් හා විකිණුම් ඇණවුම් භාර ගැනීම
2. ආයෝජකයින් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කර දීම.
3. කොටස් ණයකරවල ආයෝජනය සම්බන්ධයෙන් ආයෝජකයින්ට උපදෙස් සැපයීම
4. සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම
5. සීමාසහිත පොදු සමාගම් වල ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහය වීම.
6. කොටස් වෙළඳපල විශ්ලේෂණය කිරීම සහ වෙළඳපල සමීක්ෂණ වාර්තා සැකසීම

## ප්‍රාථමික අලෙවිකරුවන්

රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි වන වෙළඳපල 'ප්‍රාථමික වෙළඳපල' යි. මෙම ප්‍රාථමික වෙළඳපලට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති ආයතන 'ප්‍රාථමික අලෙවිකරුවන්' ලෙස හඳුන්වයි. උදා: කැපිටල් එලායන්ස් සමාගම, ලංකා බැංකුව

ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යභාරය

1. ප්‍රාථමික වෙන්දේසි වලට සහභාගි වීම
2. භාණ්ඩාගාර සුරැකුම්පත් සම්බන්ධයෙන් ද්විතියික වෙළඳපල තුළ කටයුතු කිරීම

## ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්

නව ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ලීමේ අරමුණින් කටයුතු කරන ආයතන විශේෂයකි. නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිලදී ගැනීම වැනි කටයුතු වලදී අරමුදල් සැපයීම, කොටස් ප්‍රාරක්ෂණය හා ණය සම්මේලනය යනාදිය ද සිදු කරයි.

## වෙළඳපල අතරමැදියන්

ප්‍රධාන වශයෙන් ආයතන කිහිපයක් මීට ඇතුළත් වේ.

1. ණය ඇගයීමේ ආයතන (උදා : ෆිච් රේටින්, මූඩිස් ඉන්වෙස්ට්මන්ට්ස්, ඉක්රා ලංකා)
   සමාගමක ණය සුරැකුම්පත්වල ණය ගුණත්වය පිළිබඳ ඇගයීමක් ලබා දීම සිදුකරයි.
2. ආයෝජන කළමනාකරුවන් (උදා : අමානා කැපිටල් සමාගම, බාටලී ට්‍රාන්ස්කැපිටල් සමාගම)
   ආයෝජන ප්‍රතිපත්ති සකස් කිරීම, ආයෝජන විශ්ලේෂණය සහ තෝරා ගැනීම, ආයෝජන කළඹක් නිර්මාණය කිරීම, ආයෝජන කළමනාකරණය කිරීම, ආයෝජන පිළිබඳ උපදෙස් ලබා දීම ආදිය සිදු කරන ආයතන
3. අන්ත-ණය සැපයුම්කරුවන් (උදා : කොමර්ෂල් බැංකුව, DFCC බැංකුව)
   වෙළඳ ආයතනය ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළඳ ණය අය කිරීම සහ ණය මිලදී ගැනීම සිදු කරනු ලබන ආයතන වේ.
4. ප්‍රාරක්ෂකයින් (උදා : කොමර්ෂල් බැංකුව, HNB බැංකුව)
   සමාගමක් මහජනයාට කරන සුරැකුම් නිකුතුවකදී එම සුරැකුම්පත් වලින් මහජනයා මිලට නොගන්නා ප්‍රමාණය මිලට ගැනීමට එකඟ වන ආයතන
5. නිෂ්කාශන ආයතන (උදා : මධ්‍යම තැන්පතු ක්‍රම පෞද්ගලික සමාගම)

## රක්ෂණ සමාගම්

විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මගින් ගොඩනැගෙන අරමුදල්, මූල්‍ය වෙළඳපල ණය දීම හා ආයෝජනය කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණයේ නිරත වන ආයතන වේ.

උදාහරණ ලෙස,

- සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
- සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම
- සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම

## සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා පවතින විශාලතම විශ්‍රාම අරමුදල මෙය වන අතර කම්කරු කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන අතර මහ බැංකුව විසින් කළමනාකරණ කටයුතු සිදු කරයි.

## සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල


විශ්‍රාම අරමුදල් අතර දෙවන විශාලතම අරමුදල මෙය වන අතර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය කරනු ලබයි.

## රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල

මෙම අරමුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබයි.

## චෙක්පත් භාවිතය

### චෙක්පතක මූලික ලක්ෂණ



## චෙක්පතක් යනු

**"නිශ්චිත පුද්ගලයෙකුට හෝ ඔහුගේ විධානයට හෝ ඉල්ලූ විට නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවිය යුතු යැයි නියම කරමින් ජංගම ගිණුම් හිමියෙකු විසින් තම බැංකුවට කරන ලිඛිත නියෝගයකි"**

**චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව 03 කි.**

1. **අණකරු - ගිණුම් හිමියා**
2. **අණලද්දා - ගිණුම් පවත්වාගෙන යන බැංකුව**
3. **අදායකයා - චෙක්පතෙහි නම සදහන් පුද්ගලයා / චෙක්පතේ අය ලැබීමට හිමිකරු**

   **මීට අමතරව ධාරකයා, පැවරුම්කරු සහ පවරුම්ලාභියද චෙක්පතකට සම්බන්ධ පාර්ශ්ව ලෙස හදුනා ගත හැකිය.**
   **පැවරුම්කරු අදයකයාම විය හැකි අතර පැවරුම්කරු ධාරකයා විය හැකිය.**

<u>චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>

- **පහසුවෙන් නොමැකෙන තීන්ත වර්ගයක් භාවිත කිරීම**
- **පිලිපතේ අදාළ විස්තර සටහන් කර ගැනීම**
- **එකම භාෂා මාධ්‍යයක් යොදා ගැනීම**
- **අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදීම**
- **හිස් චෙක්පත් වලට අත්සන් නොයෙදීම**
- **චෙක්පතට යොදන දිනය හා ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම**

<u>චෙක්පත් වර්ග</u>

**චෙක්පත් ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි. එනම්,**

1. <u>ධාරක චෙක්පත්</u>
   **දරන්නාට අයිතිය හිමිවන හුදු භාර දීමෙන් පවරිය හැකි චෙක්පත් ය.**
   ***ලක්ෂණ***
   - **චෙක්පතේ මුද්‍රිත 'හෝ රැගෙන එන්නාට' යන පදය කපා නොහැර තිබීම.**
   - **ආදායකයාගේ නම වෙනුවට 'මුදල්' යන්න ලියා තිබීම.**
   - **අවසාන පිටසන හිස් පිටසනකින් යුත් විධාන චෙක්පතක් වීම.**

2. <u>විධාන චෙක්පත්</u>
   **අදායකයාට හෝ ඔහුගේ විධානයට පමණක් චෙක්පතේ සදහන් මුදල ගෙවනු ලබන චෙක්පත් මෙනමින් හැදින්වේ. මේවා පැවරීමේදී පිටසන් කිරීම අනිවාර්ය වේ.**
   ***ලක්ෂණ***
   - **'හෝ රැගෙන එන්නාට' යන පදය කපා හැර තිබීම.**
   - **'හෝ අණට' යන පදය කපා නොහැර තිබීම.**

<u>චෙක්පත් රේඛනය</u>

**චෙක්පතක මුහුණත හරහා සමාන්තර ඉරි දෙකක් ඇඳීම හෝ බැංකුවක නමක් සදහන් කිරීම චෙක්පත් රේඛනය ලෙස හඳුන්වයි.**


**චෙක්පතකට සම්බන්ධ ඕනෑම පාර්ශ්වයකට චෙක්පත රේඛනය කළහැකි අතර චෙක්පතක රේඛනය අවලංගු කල හැක්කේ චෙක්පතේ අණකරුට පමණි.**

<u>චෙක්පත් රේඛනයේ අවශ්‍යතාව</u>


- **චෙක්පතට කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැලැක්වීම.**
- **චෙක්පතට අමතර ආරක්ෂාවක් ලබා දීම.**
- **චෙක්පතේ සදහන් වටිනාකම එහි ආදායකයාට ලැබීම සහතික කිරීම.**

**චෙක්පත් රේඛන වර්ග දෙකකි.**

1. **සාමාන්‍ය රේඛනය**
   **වගන්ති සහිතව හෝ රහිතව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය ලෙස හැදින්වේ.**




2. **විශේෂ රේඛනය**
   **සරල සමාන්තර ඉරි දෙකක් සහිතව හෝ රහිතව චෙක්පතක මුහුණත හරහා වාණිජ බැංකුවක නමක් සදහන් කිරීම විශේෂ රේඛනය ලෙස හැදින්වේ.**




- **'ගනුදෙනු කල නොහැක' යන්නෙන් අදහස් වන්නේ එම චෙක්පත පැවරීමේදී පැවරුම්කරුට තිබූ අයිතියට වඩා වැඩි අයිතියක් පවරුම්ලාභියට හිමි නොවන බවය. එබැවින් මෙවැනි චෙක්පතක් ලබා ගැනීමේදී පවරුම්ලාභියා සැලකිලිමත් විය යුතුය.**
- **'ආදායකයාගේ ගිණුමට පමණි' යන්නෙන් අදහස් වන්නේ චෙක්පතේ නම සඳහන් ආදායකයාගේ ගිණුමට තැන්පත් කිරීමෙන් පමණක් මුදල් ලබා ගත හැකි බවයි.**
- **'රු XXXX දකවා පමණයි' යනුවෙන් අදහස් වන්නේ සඳහන්ව ඇති මුදල් ප්‍රමාණයට වඩා වැඩි වටිනාකමක් චෙක්පත් වටිනාකමේ සදහන් නොවිය යුතු බවය.**

රේඛිත චෙක්පත් ව්‍යාපාරිකයන් අතර වඩා ජනප්‍රිය වීමට හේතු

1. වංචනික ක්‍රියාවලට ඇති ඉඩකඩ අවම වීම.
2. ගෙවීම් ප්‍රමාද කිරීමට අවස්ථාව ලැබීම.
3. ආරක්ෂිතබව ඉහළ වීම.
4. කිසියම් වංචනික ක්‍රියාවකදී නීතිමය පියවර ගැනීමට හැකි වීම.
5. තැපැලෙන් යවන චෙක්පත් සඳහා අමතර ආරක්ෂාවක් හිමි වීම.

චෙක්පත් පිටසන් කිරීම

චෙක්පතේ සඳහන් වන ආකාරයටම ආදායකයා විසින් සිය නම චෙක්පත පිටුපස ලිවීම චෙක්පත් පිටසන් කිරීම ලෙස හඳුන්වයි. චෙක්පත නීත්‍යානුකූලව පැවරූ බව සනාථ කිරීම පිටසන මගින් සිදුවේ.

පිටසන යෙදීම අවශ්‍ය වන අවස්ථා

- ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේදී
- විධාන චෙක්පතක් අන් අයෙකුට පැවරීමේදී
- රේඛනය නොකළ චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීමේදී

පිටසන් වර්ග කිහිපයකි.

1. හිස් පිටසන
   පවරුම්කරුගේ නම පමණක් පිටසන ලෙස යෙදීම හිස් පිටසනකි. මේ නිසා විධාන චෙක්පතක්, ධාරක චෙක්පතක් බවට පත්වේ.

2. සීමාකාරී පිටසන
   ගෙවීම් ලැබිය යුතු අයගේ නම සඳහන් කොට චෙක්පත තවදුරටත් පැවරීම අහෝසි කරන පිටසනයි.
   උදා : සුසිලා ගමගේ ට පමණක් ගෙවන්න. - සිරිපාල ගමගේ

3. විශේෂ පිටසන
   ගෙවීම ලැබිය යුතු පුද්ගලයාගේ නම විශේෂයෙන් සඳහන් කොට කෙරෙන පිටසනයි.
   උදා : සුසිලා ගමගේ ට හෝ ඇණවුමට පමණක් ගෙවන්න - සිරිපාල ගමගේ

4. කොන්දේසි සහිත පිටසන
   චෙක්පත පැවරීම කිසියම් කොන්දේසියක් ඉටු කිරීමට යටත්ව කෙරෙන පිටසනයි.
   උදා : බඩු තොගය ලැබී ඇත්නම් පමණක් ගෙවන්න. - සිරිපාල ගමගේ

චෙක්පත් අගරු වීම

චෙක්පතකට මුදල් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කල විට, බැංකුව චෙක්පතට මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම චෙක්පත අගරු වීමක් ලෙස හඳුන්වයි.

චෙක්පතක් අගරු විය හැකි විවිධ ආකාර / අවස්ථා

1. ගිණුමේ මුදල් නොමැති වීම
2. අණකරු විසින් ගිණුමෙන් ගෙවීම් කිරීම නවතා ඇති විට
3. චෙක්පත නිසියාකාරව ලියා නොමැති විට
4. ගිණුම වසා ඇති විට
5. චෙක්පත බොඳ වී, අපැහැදිලි වී ආදී වශයෙන් විකෘති වී ඇති විට

## විද්‍යුත් මුදල්

**"භෞතික මුදල් විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තබා ගනුදෙනු කිරීමත් සමග එහි වටිනාකම අඩු වන ආකාරයට සකසා ඇති කාඩ්පත් විශේෂයක් හෝ මෘදුකාංග නිෂ්පාදනයක්" විද්‍යුත් මුදල් ලෙස හඳුන්වයි.**

<u>විද්‍යුත් මුදල් කාඩ්පතක දැකිය හැකි ලක්ෂණ</u>

1. නිකුත් කරන ආයතනයේ නම සහ ලාංඡනය
2. කාඩ්පත් වර්ගය
3. කාඩ්පත් අංකය
4. සන්නම් ලාංඡනය
5. කල්ඉකුත් වන දිනය
6. කාඩ්පත් හිමියාගේ නම
7. චුම්භක පටිය
8. ත්‍රිමාන චිත්‍රය

<u>විද්‍යුත් මුදල් වර්ග</u>

1. ණයපත් / බැරපත් **(Credit Card)**
2. හරපත් **(Debit Card)**
3. පෙර ගෙවුම් කාඩ්පත් **(Pre-Paid Card)**
4. ස්මාර්ට් කාඩ්පත් **(Smart Card)**
5. ක්ෂුද්‍ර පත් **(Micro Chips)**

<u>පෙරගෙවුම් කාඩ්පත්</u>

තමාට අවශ්‍ය සේවාව ලබා ගැනීමට පෙර මුදල් ගෙවා ලබා ගත යුතු කාඩ්පත් විශේෂයකි. බැංකු ගිණුම් නොමැති අයට වුවද පෙරගෙවුම් කාඩ්පත් භාවිතය මගින් විද්‍යුත් ක්‍රමයට ගෙවීම් කල හැකිය.

උදාහරණ ලෙස

- දුරකථන කාඩ්පත්
- **Travell Pass**
- **Sampath Web Card**
- **Seylan Prepaid Card**

<u>ස්මාර්ට් කාඩ්පත්</u>

මුදල් වටිනාකම සහිත සිම්පතක් අන්තර්ගත කොට ඇති කාඩ්පත් විශේෂයකි. මෙය භාවිතා කර ගනුදෙනුවක් සිදු කල විට එම ගනුදෙනුවේ වටිනාකම හර වී ශේෂය අඩුවේ. අදාළ නිකුතු ආයතනයට වරින් වර මුදල් ගෙවා ගබඩා කරගෙන නැවත නැවත ගනුදෙනු සිදු කල හැකිය. ස්මාර්ට් කාඩ්පත් ඔස්සේ ණයපත් සහ හරපත් දෙවර්ගයේහිම කාර්යයන් සිදු කළ හැකි අතර මෙය විද්‍යුත් මුදල් පසුම්බියක් **(e-purse)** ලෙසද භාවිතා කල හැකිය.

## ණයපත් (Credit Card)

**කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළඳ ආයතන වලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂයකි.**

උදාහරණ ලෙස,

- සි බැන්ක් විසා - ලංකා බැංකුව
- පීපල්ස් විසා - මහජන බැංකුව
- මාස්ටර් කාඩ් - සම්පත් බැංකුව
- සෙලාන් විසා - සෙලාන් බැංකුව

ව්‍යාපාරිකයෙකුට ණයපතක් ඉදිරිපත් කල විට එහි වලංගුභාවය සහ ණය සීමාව පරීකෂා කිරීම සඳහා 'විද්‍යුත් සත්‍යාපන ක්‍රම' යොදා ගැනෙයි.

ණයපතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව

1. ණයපත් හිමියා
2. ණයපත් මගින් භාණ්ඩ විකුණනු ලබන ආයතනය / විකිණුම්කරු
3. ණයපත් නිකුතු ආයතනය
4. ණයපත් සංගමය / ණයපත් විකුණනු ලබන ආයතනය

<u>ණයපත් භාවිතය නිසා වෙළෙඳුන්ට සහ ගනුදෙනුකරුවන්ට සිදුවන වාසි-අවාසි</u>

- වෙළෙඳුන්ට සිදුවන වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| • ණයට විකුණූ භාණ්ඩ සඳහා මුදල් ලැබීම ස්ථිර වීම.<br>• වෙළඳ පිරිවැටුම වැඩි වීම නිසා ලාභය ඉහළ යාම.<br>• ගනුදෙනු පහසු වීම.<br>• කේවල් කිරීම් මගින් භාණ්ඩ වල මිල අඩු කිරීම් තත්ව අවම වීම.<br>• නොමිලේ ප්‍රචාරණයක් ලැබීම. | • බැංකුවට කොමිස් මුදලක් ගෙවීමට සිදු වීම.<br>• කාරක ප්‍රාග්ධන හිඟයන්ට මුහුණ පෑමට සිදු විය හැකි වීම.<br>• විශේෂ පුහුණුවක් සහිත සේවකයන් අවශ්‍ය වීම.<br>• විදුලිය ඇනහිටීම වලදී භාවිත කල නොහැකි වීම. |

- ගනුදෙනුකරුවන්ට සිදුවන වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| • ණය ගනුදෙනු පහසුවෙන් සිදු කල හැකි වීම.<br>• කෙටි කාලින ණයක් ලෙස භාණ්ඩ ලබා ගත හැකි වීම.<br>• ණයපත් ලබා ගැනීමට බැංකු ගිණුමක් අවශ්‍ය නොවීම.<br>• යම් කාලසීමාවක් දක්වා පොළී රහිත ණයක් වීම.<br>• අනුමත සීමාව තුළ මුදල් ද ලබා ගත හැකි වීම. | • ණයපතට මුදල් ගෙවීම ප්‍රමාද වීමෙන් දඩ මුදල් ගෙවීමට සිදු වීම.<br>• සෑම අලෙවිසැලකින්ම ගනුදෙනු කල නොහැකි වීම.<br>• අනවශ්‍ය පරිභෝජනයකට නැඹුරු වීම.<br>• වෙළඳපොළෙහි තරඟකාරී මිල ගණන් යටතේ මිලදී ගැනීම් අවස්ථා අහිමි වීම. |

## <u>හරපත් (Debit Card)</u>

බැංකු ගිණුම් හිමියෙකුට තම ගිණුමේ ඇති මුදල් වෙළඳසැල් ගෙවීම් පියවීමටත්, ටෙලර් යන්ත්‍ර මාර්ගයෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහාත් බැංකුව විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි.

උදාහරණ ලෙස,

- **SET -** සම්පත් බැංකුව
- **PET -** මහජන බැංකුව
- **Catsuper -** කොමර්ෂල් බැංකුව

හරපත් භාවිතයෙන් ගනුදෙනුකරුවන්ට සිදුවන වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| • පොළියක් ගෙවිය යුතු නොවීම.<br>• දේශීය මෙන්ම ජාත්‍යන්තර ගනුදෙනු සඳහාද යොදාගත හැකි වීම.<br>• මුදල් ගෙවීමට නිශ්චිත කාලයක් නොමැති වීම.<br>• ATM හරහා මුදල් ලබා ගත හැකි වීම.<br>• ගනුදෙනුව එවෙලෙහිම නිම වීම. | • ගිණුමක් තිබීම අනිවාර්ය වීම.<br>• ගිණුමේ ශේෂයට ගනුදෙනු සීමා වීම.<br>• තාක්ෂණික දෝෂ<br>• වංචා සහ අක්‍රමිකතා සිදු වීමට ඇති ඉඩකඩ |

හරපත් භාවිතයෙන් වෙළඳුන්ට සිදුවන වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| • අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් ලෙස යොදාගත හැකි වීම.<br>• කේවල් කිරීම් අඩු වීම.<br>• ක්ෂණිකව ගිණුමගත වීම.<br>• වෙළඳසැල තුළ මුදල් එක්රැස් නොවන නිසා ආරක්ෂා සහිත වීම. | • විකිණුම් මත කොමිස් මුදලක් ගෙවීමට සිදු වීම.<br>• විකුණන අවස්ථාවේදීම මුදල් නොලැබී යාම.<br>• කාරක ප්‍රග්ධන හිඟයන්ට මුහුණ පෑමට සිදු වීම.<br>• තාක්ෂණික ගැටළු<br>• වංචනික ක්‍රියා මත අලාභ සිදු වීම |

හරපත් භාවිතයෙන් බැංකුවට සිදුවන වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| • තැන්පතුකරුවන් සංඛ්‍යාව ඉහළ යාම<br>• කවුන්ටර්වල තදබදය අඩු වීම.<br>• පිරිවැය පහළ යාම<br>• ණය සැපයීමකින් තොරව අමතර අදායමක් ලබා ගත හැකි වීම. | • ගනුදෙනුකරුවන් බැංකුව වෙත පැමිණීම අඩු වීම නිසා සිදුවන අවාසිදායක තත්වයන්<br>• ණයපත් ලබා ගැනීම අඩු වීම<br>• ප්‍රවර්ධන කටයුතු සඳහා පිරිවැයක් දැරීමට සිදු වීම<br>• වංචනික කාඩ්පත් භාවිතය සම්බන්ධ ගැටළු වලට මුහුණ දීමට සිදු වීම |

ණයපත් හා හරපත් අතර වෙනස්කම්

| හරපත් | ණයපත් / බැරපත් |
|---|---|
| • බැංකු ගිණුමක් පැවතීම අවශ්‍ය වේ.<br>• මුදල් ලබා ගැනීමේදී පොළියක් අය නොකරයි.<br>• බැංකු ශේෂය ඉක්මවා ගනුදෙනු කල නොහැකිය.<br>• ATM මගින් මුදල් ලබා ගත හැකිය. | • බැංකු ගිණුමක් අනිවාර්ය නොවේ.<br>• මුදල් ලබා ගැනීමේදී පොළියක් අය කරයි.<br>• භාණ්ඩ හා සේවා ණයට ලබා ගත හැකි ක්‍රමයකි.<br>• අදාළ වෙළඳ ආයතන වල ඇති යන්ත්‍ර භාවිත කරයි. |

<u>විද්‍යුත් මුදල් වලින් ගනුදෙනු කිරීමේ වාසි</u>

1. ගනුදෙනු කිරීමේ පිරිවැය අඩු වීම
2. මුදලේ ආරක්ෂාව තහවුරු වීම
3. දවසේ පැය 24 පුරාම සේවය
4. ගෙවීම් කටයුතු පහසු වීම
5. විවිධ ප්‍රතිලාභ හිමි වීම
6. ජාත්‍යන්තර ගනුදෙනු සඳහාද භාවිත කල හැකි වීම

<u>විද්‍යුත් මුදල් වලින් ගනුදෙනු කිරීමේ අවාසි</u>

1. පොළී, ප්‍රමාද ගාස්තු සඳහා පිරිවැය දැරීමට සිදු වීම
2. වංචනික ක්‍රියා සිදු වීම
3. අනවශ්‍ය පරිභෝජන රටාවන්ට හුරු වීම
4. තාක්ෂණික දෝෂ නිසා ඇතිවන බාධා
5. සියළුම දෙනාට භාවිතා කිරීමට අවස්ථාවක් නොමැති වීම